**ශීර්ෂය 220 - ආයුර්වේද දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 220 - ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 20 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම.**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,741.97 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,522.03 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 219.94 ක් හෙවත් සියයට 12.63 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,166.97 | 1,109.02 | 57.95 | 4.97 |
| මූලධන | 575.00 | 413.01 | 161.99 | 28.17 |
| **එකතුව** | **1,741.97** | **1,522.03** | **219.94** | **12.63** |

**2.2** **අත්තිකාරම් ගිණුම**

**---------------------**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**-------------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**-------------------------------------------------**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 22001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 36.68 | 33.36 | 27.68 | 33.71 | 190.00 | 80.34 |

**2.3** **පොදු තැන්පත් ගිණුම්**

**---------------------**

දෙපාර්තමේන්තුව යටතේ පොදු තැන්පත් ගිණුම් 04 ක් පැවැති අතර 2015 දෙසැම්බර් 31 දින වන විට එම ශේෂවල එකතුව රු.මිලියන 11.18 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0002/0127/000 | 2.95 |
| 6000/0000/00/0016/0076/000 | 7.59 |
| 6000/0000/00/0018/0082/000 | 0.13 |
| 6000/0000/00/0019/0019/000 | 0.51 |
| | ----- |
| **එකතුව** | **11.18** |
| | **=====** |

**2.4** **විගණන නිරීක්ෂණය**

**----------------------**

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1. ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (ඈ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (ඉ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඉ) |

### 3.2 විගණන සාක්ෂි නොවීම

දෙපාර්තමේන්තුවට අදාළ මුදල් රෙගුලාසි 272(2) ප්‍රකාරව කටයුතු නිම නොකළ රු.99,700,989 ක් වටිනා ගෙවීම් වවුචර් 112 ක් අස්ථානගත වී තිබුණි.

### 3.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 25 කටද, ඉකුත් වර්ෂයේදී නිකුත් කළ විගණන විමසුම් 01 කටද, 2016 ජූලි 25 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.501,900,434 ක් විය.

### 3.4 විසර්ජන ගිණුම

#### අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා හේතුවෙන් මූලධන වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු රු.6,800,000ක සම්පූර්ණ ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා හේතුවෙන් මූලධන වැය විෂයයන් 11 ක් සඳහා සලසා තිබුණු රු.205,387,219 කින් රු.138,434,700 ක් ඉතිරිවී තිබුණු අතර ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 60 ක සිට සියයට 93 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

විෂය අංක 22001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, 2015 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ණය ශේෂවල එකතුව රු.1,627,020 ක් වී තිබුණි. එම හිඟහිටි ශේෂ වර්ෂ 05 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, 2015 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව විසින් බේරුම් කිරීමට කටයුතු කර නොතිබුණු ණය ශේෂ 03 ක එකතුව රු.407,009 ක්වූ අතර ඉන් ණය ශේෂ දෙකක් පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) නිලධාරීන් 09 දෙනෙකුට නිකුත්කර තිබුණු එකතුව රු.2,177,320 ක දේපල ණයවලට අදාළ අවලංගු කළ නොහැකි ඇටෝර්නි බලපත්‍ර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණි.

## 3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### (අ) අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතුණි.

### (ආ) වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ඔක්තෝබර් 10 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.7 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

අක්කර 6.5 කින් යුක්තවූ පින්නදූව ඔසු උයනේ අක්කර 1 ක පමණ භූමි ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂයේදී ඖෂධ වගාවන් සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුනි.

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා 2016 ඔක්තෝබර් 30 දින

වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

බැරකම් ලේඛනයක් පවත්වා නොතිබුණු බැවින් විසර්ජන ගිණුමේ දක්වා තිබුණු රු.269,553,570 ක්වූ බැරකම්වල නිවැරදිතාවය පරීක්ෂා කළ නොහැකි විය. ඉන් රු.23,762,018 ක බැරකම් වවුචර් හා ඉන්වොයිසි මගින් තහවුරු කර නොතිබුණි. ඊට අමතරව රු.155,213 ක බැරකම් දෙවරක් ඇතුළත් කර තිබුණු අතර රු.1,098,587 ක බැරකම් ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි.

## 3.8 අනුකූල නොවීම

**(අ) නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| ▪ මුදල් රෙගුලාසි 104 | සමාලෝචිත වර්ෂයේදී සිදුවී තිබුණු වාහන අනතුරු 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| ▪ මුදල් රෙගුලාසි 237(අ) | කොන්ත්‍රාත්තුවට හෝ ගිවිසුමට අනුව සතුටුදායක ලෙස වැඩකර ඇති බවට හෝ සැපයුම කර ඇති බවටද, නිර්දේශිත ගෙවීම් ඒවාට අනුකූල වන බවටද සහතිකයක් ලබා ගත යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී එවැනි සහතිකයක් ලබා නොගෙන එකතුව රු.1,536,735 ක් වූ ගෙවීම් වවුචර් 02 ක් සඳහා ගෙවීම් කර තිබුණි. |
| ▪ මුදල් රෙගුලාසි 260 | සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් වවුචරයේ නම සඳහන් නිලධාරියා වෙනුවට වෙනත් නිලධාරියෙකු වෙත රු.15,000 ක අත්තිකාරම් ගෙවා තිබුණි. |
| ▪ මුදල් රෙගුලාසි 264(1) | ගෙවීම් වවුචර් 05 ක් මගින් එකතුව රු.5,685,039 ක් ගෙවා තිබුණත්, එම මුදල් ලබා ගත් බවට ආදායකයාගෙන් කුවිතාන්සි ලබා ගෙන නොතිබුණි. |

| | |
|---|---|
| ▪ මුදල් රෙගුලාසි 267 | දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ මාස 04 ක දී නිලධාරීන් 425 දෙනෙකු වෙත දීමනා ලෙස ගෙවා තිබුණු මුළු මුදල රු.19,329,491 ක් ලබා ගත් බවට අදාළ නිලධාරීන් තහවුරු කර නොතිබුණි. |
| ▪ මුදල් රෙගුලාසි 371 | (i). කාර්ය නිම කළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කළ යුතු වුවත්, නිලධාරීන් 08 දෙනෙකු වෙත නිකුත් කර තිබුණු එකතුව රු.243,371 ක තත්කාර්ය අතුරු අග්‍රිම දින 30 ක සිට දින 210 ක කාල පරාසයක ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි.<br><br>(ii). අදාළ කාර්ය නිසි ලෙස හඳුනා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 14 දෙනෙකුට නිකුත් කර තිබුණු එකතුව රු.197,259 ක තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය ඉටු නොකර දින කිහිපයක් අත රඳවාගැනීමෙන් පසු ආපසු ගෙවා තිබුණි. |

**(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

--------------------------

| | |
|---|---|
| ▪ 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | 2011 වර්ෂයෙන් පසු දෙපාර්තමේන්තුවේ වාහනවල දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. |
| ▪ 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන චක්‍රලේඛයේ 02 ඡේදය | විගණන දිනය වූ 2016 ජුනි 17 දින වන විට සංචිත වාහන 05 ක රාජ්‍ය ලාංඡනය පිංතාරු කර නොතිබුණි. |

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

----------------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවන් හෝ සැපයුම්කරුවන් වෙත ගෙවන ලද එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර එකතු කළ අගය මත බදු ගෙවූ මාසයට පසු මාසයේ 15 දිනට පෙර විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු විය. සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන් වෙත ගෙවා තිබුණු එකතු කළ අගය මත බදු රු.31,689,300 ක් පිළිබඳව විස්තර දැනුම් දී නොතිබුණි. තවද එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි අංකය සඳහන් නොකළ ඉන්වොයිසි දෙකක් සඳහා එකතු කළ අගය මත බදු ලෙස පිළිවෙලින් රු.84,830 ක් හා රු.166,250 ක් ගෙවා තිබුණි.

**3.9 කාර්යසාධනය**

----------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ)** 2015 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු පහත සඳහන් කාර්යයන් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ඉටුකර නොතිබුණි.

**(i)** දේශීය ඔසු වගාව දියුණු කිරීමේ අරමුණින් ඇස්තමේන්තුගත පිරිවැය රු.1,000,000 ක් වූ පැල අලෙවි සැලක් ඉදිකිරීම.

**(ii)** ක්‍රමානුකූල බව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් ඇස්තමේන්තුගත පිරිවැය රු.500,000 ක් වූ ලේඛනාගාරයේ රාක්ක සවිකිරීම.

**(iii)** සේවක සුභසාධනය අරමුණින් ඇස්තමේන්තුගත පිරිවැය රු.800,000 ක් වූ වැසිකිලි අළුත්වැඩියාව.

**(iv)** රෝගී ජනතාවට පහසුකම් සැලසීමේ අරමුණින් ඇස්තමේන්තුගත පිරිවැය පිළිවෙලින් රු.1,400,000 ක් හා රු.3,000,000 ක් වූ පංචකර්ම ගොඩනැගිල්ලේ 3 වන මහල අලුත්වැඩියාව හා ප්‍රධාන මල අපවහන පද්ධතිය අලුත්වැඩියාව.

**(v)** ඇස්තමේන්තුගත පිරිවැය පිළිවෙලින් රු.1,900,000 ක් රු.625,000 ක් හා රු. 625,000 ක් වූ ශ්‍රවනාගාරය ඉදිකිරීම, ආපනශාලාව හා වැසිකිලි පද්ධතිය ඉදිකිරීම සහ පළමු මහලේ විවෘත කළ හැකි දොර සඳහා ග්‍රිල් වැටක් ඉදිකිරීම.

**(vi)** ඇස්තමේන්තුගත පිරිවැය රු. 1,934,400 ක්, වූ ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම.

**(vii)** ඇස්තමේන්තුගත පිරිවැය පිළිවෙලින් රු.2,000,000 ක් හා රු.1,135,000 ක් වූ පට්ටිපොල ඔසු උයනේ ගබඩා අලුත්වැඩියාව හා වැඩිදියුණු කිරීම හා නේවාසිකාගාර වැසිකිලි අලුත්වැඩියාව.

(ආ) බොරැල්ල රෝහලේ නිෂ්පාදනාගාරයේ තෛල අංශයේ හා රස අංශයේ කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණයන් පහතින් දැක්වේ.

**(i)** බොරැල්ල රෝහලට වාර්ෂිකව අවශ්‍ය වන ඖෂධ නිෂ්පාදනය සඳහා නිෂ්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ii)** 2015 වර්ෂය සඳහා තෛල වර්ග 36 ක් නිෂ්පාදනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන තිබුණද, තෛල වර්ග 24 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි.

**(iii)** 2015 වර්ෂයට අවශ්‍යතාවය ප්‍රමාණාත්මකව හඳුනා නොගෙන තෛල වර්ග 13 ක් නිෂ්පාදනය කර තිබුණි.

**(iv)** වාර්ෂික අවශ්‍යතාව හඳුනා ගෙන නොතිබුණු තෛල වර්ග 04 ක් පිටතින් මිලදී ගෙන තිබුණි.

**(v)** වාර්ෂික අවශ්‍යතාවට වඩා අඩුවෙන් රස අංශය විසින් ඖෂධ වර්ග 08 ක් නිෂ්පාදනය කර තිබුණි.

**(vi)** බුද්ධරාජ කල්කය හා රජ:ප්‍රවර්ධන වටී ඖෂධවල වාර්ෂික අවශ්‍යතාව පිළිවෙලින් කිලෝ ග්‍රෑම් 183 ක් හා කිලෝ ග්‍රෑම් 27 ක් වුවද, අබිං හා තිත්ත අබිං සපයා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එම ඖෂධ නිෂ්පාදනය කර නොතිබුණි.

**3.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**-----------------------------------**

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2015 ජුනි 16 දිනැති අංක SH/PSD/SU/June/626/2 දරන ලිපියෙන් දැනුම්දී තිබුණු පරිදි, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව විසින් රාජ්‍ය නොවන සංවිධානයක් වෙත ලබාදී තිබුණු ඖෂධ වෙනුවෙන් එම සංස්ථාව වෙත රු.731,700 ක් ගෙවා තිබුණි.

**3.11 පාඩු හා හානි**

**---------------**

දෙපාර්තමේන්තුවේ ලොරි රථය 2014 ජුනි 03 දින සිට ජුනි 27 දින දක්වා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට ලබාදී තිබුණු නමුත්, ඒ වෙනුවෙන් අයකර ගත යුතු කුලිය රු.102,261 ක් විගණිත දිනය වූ 2016 ජුනි 17 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

**3.12 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

------------------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අඩුපාඩු පහත පරිදි විය.

(අ) කොන්ත්‍රාත් වටිනාකම රු.6,346,173 ක් වූ පට්ටිපොළ ඔසු උයනේ මුළුතැන්ගෙය ඉදිකිරීම දෙවන අදියරට අදාළ කොන්ත්‍රාත්තුවේ කටයුතු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන විධිවිධානවලට පටහැනිව සිදුකර තිබුණි. විස්තර පහත දැක්වේ.

**(i)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 මාර්ගෝපදේශය ප්‍රකාරව, තාක්ෂණික ඇගයීම් කමිටුව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පත්කර නොතිබුණි.

**(ii)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.3 මාර්ගෝපදේශය ප්‍රකාරව, ආරම්භක මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙළ කිරීමෙන් පසු ලංසු කැඳවීම සඳහා සැලෙන කාලයක් ගතවුවහොත්, උද්ධමනය සහ වෙනත් කරුණු සැලකිල්ලට ගෙන මුළු පිරිවැය ඇස්තමේන්තුව යාවත්කාලීන කර අදාළ අධිකාරිය විසින් අනුමත කරනු ලැබිය යුතුව තිබුණි. ඊට පටහැනිව ඌව පළාතේ මිල රේටයන් පදනම් කරගෙන පිළියෙල කර තිබුණු රු.5,126,963 ක මුල් ඇස්තමේන්තුව බස්නාහිර පළාත් මිල රේටයන් පදනම් කරගෙන රු.6,362,462 ක් දක්වා සංශෝධනය කර තිබුණි. සංශෝධිත ඇස්තමේන්තුව මුල් ඇස්තමේන්තුවට වඩා රු.1,235,499 කින් වැඩිවී තිබුණු නමුත් ඌව පළාතේ මිල රේටයන්වලින් බැහැරවීමට හේතු ඉදිරිපත් කර නොතිබුණි.

**(iii)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසු කැඳවීමේ අවම කාල සීමාව දින 14 ක් විය යුතු වුවද, ඒ සඳහා දින 10 ක් පමණක් ලබාදී තිබුණි.

**(iv)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, කොන්ත්‍රාත් කාලය දින 180 කින් දීර්ඝ කර තිබුණු නමුත් කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් බැහැරවූ අවස්ථානුගත හේතූන් අනුව ප්‍රමාදය සිදුවූවේද යන්න තහවුරු කර ගෙන නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් වටිනාකම රු.1,113,158,908 ක් වූ බොරුල්ල ආයුර්වේද රෝහල ඉදිකිරීමේ දෙවන අදියරට අදාළ කොන්ත්‍රාත්තුවේ කටයුතු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන විධිවිධානවලට පටහැනිව කටයුතු කරමින් සිදුකර තිබුණි. විස්තර පහත දැක්වේ.

**(i)** අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරාගෙන තිබුණු අවම ලංසුකරු වෙත 2008 නොවැම්බර් 24 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.727,554,842 ක් වී තිබුණි. නමුත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, කොන්ත්‍රාත්කරු සමඟ ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි.

**(ii)** 2014 වර්ෂය අවසන් වන වටත් ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොතිබුණු අතර කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීමකට අනුව මුල් කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 53 කට සමාන රු.385,604,066 ක් එකතු කර මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.1,113,158,908 කට මුල් කොන්ත්‍රාත්කරු වෙතම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට 2014 දෙසැම්බර් 04 දින අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. නමුත් ඊට ප්‍රථම 2012 අගෝස්තු 07 දිනැති අංක 02/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව අවශ්‍ය අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් 06 දෙනෙකුගෙන් 03 දෙනෙකු පමණක් එම තීරණය සඳහා අනුමැතිය ලබාදී තිබුණි.

**(iii)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර කොන්ත්‍රාත්තුවේ වියදම සපුරාලීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන තිබෙන බවට ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් සහතික විය යුතුව තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා නොගෙන බොරුල්ල ආයුර්වේද රෝහල ඉදිකිරීමේ දෙවන අදියරට අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. මේ හේතුවෙන් 2015 ඔක්තෝබර් මාසය වන විට කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට සිදුවී තිබුණු ප්‍රමාද ගාස්තුව රු.11,895,234 ක් වී තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන විධිවිධානවලට පටහැනිව කටයුතු කරමින් කොන්ත්‍රාත් වටිනාකම රු.1,400,736 ක් වූ පින්නදූව ඔසු උයන වටා බාධක බැම්ම සහ වැට ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, ඉංජිනේරුවරයා විසින් වැඩ අවසන් කිරීමේ සහතිකයක් නිකුත් කර නොතිබුණි.

**(ii)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 මාර්ගෝපදේශය ප්‍රකාරව, අදාළ අධිකාරී බලය ලත් තැනැත්තන්ගේ අනුමැතියකින් තොරව අමතර වැඩ සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමේ මිලෙන් සියයට 24 ක් වූ රු.349,500 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන විධිවිධානවලට පටහැනිව කටයුතු කරමින් කොන්ත්‍රාත් වටිනාකම රු. 2,644,623 ක් වූ කන්නෙලිය ඔසු උයනේ මායිම් වැට ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, ඉංජිනේරුවරයා විසින් වැඩ අවසන් කිරීමේ සහතිකයක් නිකුත්කර නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 මාර්ගෝපදේශය ප්‍රකාරව, අදාළ අධිකාරී බලය ලත් තැනැත්තන්ගේ අනුමැතියකින් තොරව අමතර වැඩ සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමේ මිලෙන් සියයට 24 ක් වූ රු.211,162 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන විධිවිධානවලට පටහැනිව කටයුතු කරමින් කොන්ත්‍රාත් වටිනාකම රු.6,062,730 ක් වූ කන්නෙලිය ඔසු උයනේ සංචාරක බංගලාවේ මුළුතැන්ගෙය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සිදුකර තිබුණි. විස්තර පහත දැක්වේ.

**(i)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 මාර්ගෝපදේශය ප්‍රකාරව, අදාළ අධිකාරී බලය ලත් තැනැත්තන්ගේ අනුමැතියකින් තොරව අමතර වැඩ සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමේ මිලෙන් සියයට 21 ක් හෙවත් රු.1,295,342 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

**(ii)** කොන්ත්‍රාත් ගිවිසුම අනුව දින 90 ක් තුළ අදාළ කාර්යය නිමකළ යුතු අතර, ප්‍රමාද වන දිනකට රු.3,031.37 බැගින් ප්‍රමාද ගාස්තු අයකළ යුතුව තිබුණි. සත්‍ය ප්‍රමාද කාලය දින 105 ක් වුවද දින 33 කට පමණක් රු.100,035 ක ප්‍රමාද ගාස්තු අයකර ගෙන තිබුණු අතර ඉතිරි දින 72 ක් සඳහා රු.218,259 ක ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(ඊ) අවශ්‍යතා පිරිවිතරයක්වූ රජයේ රෝහල්වලට ආහාර සැපයීම පිළිබඳව වර්ෂ 03 ක සේවා පළපුරුද්දක් නොතිබුණු සැපයුම්කරුවෙකු වෙත හම්බන්තොට චමල් රාජපක්ෂ ආයුර්වේද රෝහලට 2015 වර්ෂය වෙනුවෙන් අමු වියළි ආහාර සැපයීමට අදාළ කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(උ) ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහලට 2015 වර්ෂය සඳහා අමු හා වියළි ආහාර ද්‍රව්‍ය සැපයීමේ කොන්ත්‍රාත්තුව සඳහා දෙවන අවම මිල ඉදිරිපත් කර තිබුණු ලංසුකරු අවශ්‍ය සුදුසුකම් සපුරා තිබියදී තෙවන අවම මිල ඉදිරිපත් කර තිබුණු ලංසුවට කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් රු.1,160,503 ක අලාභයක් සිදුවී තිබුණි.

(ඌ) බොරැල්ල ආයුර්වේද රෝහලට ආරක්ෂක සේවාව සපයන ආරක්ෂක සමාගම සමඟ 2015 ජනවාරි 24 දින ඇති කර ගෙන තිබූ ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව, සේවා නියුක්ත සියළුම සේවකයන්ගේ වයස අවුරුදු 18 කට වැඩි වයස අවුරුදු 65 ත් අතර විය යුතු වුවද, වයස අවුරුදු 65 ඉක්මවූ නිලධාරීන් 04 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව, ආරක්ෂක සමාගම විසින් ආරක්ෂක නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීමට ලේඛනයක් පවත්වා නොතිබුණි. එමෙන්ම ආරක්ෂක නිලධාරීන්ගේ නම, අත්සන හා ජායාරූපය ඇතුළත් හැඳුනුම්පතක් ලබාදී නොතිබුණි. සුළු සේවා පාලක අංශයේ තිබූ ආරක්ෂක නිලධාරීන්ගේ පැමිණීමේ ලේඛනය අනුව 2015 නොවැම්බර් 09 දින ප්‍රධාන ආරක්ෂක නියාමකද ඇතුළුව ආරක්ෂක නිලධාරීන් 23 දෙනෙකු අත්සන් තබා තිබුණද, එදින ප්‍රධාන ආරක්ෂක නියාමකවරයාද සමඟ බොරැල්ල රෝහලේ රාජකාරී කරනු ලැබූ ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව 19 දෙනෙකු පමණක් බව තහවුරු විය. 2015 අගෝස්තු මාසයට අදාළව පැමිණීමේ ලේඛනවල දින 09 ක සේවා මුර කිහිපයක නිලධාරීන් අත්සන තබා නොතිබුණු නමුත් අගෝස්තු මාසයේදී දින 31 ක්ම සියළු නිලධාරීන් පැමිණි ලෙස සලකා රු.640,078 ක් ගෙවා තිබුණි.

## 3.13 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂය |
| --- | --- | --- |
| වර්ෂය | ඡේද අංකය | |
| 2014 | 4.15(අ) | 2012 ජූලි 13 දින දෙපාර්තමේන්තුවෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව වෙත ස්ථාන මාරුවී ගිය වෛද්‍යවරයෙකුට එතැන් සිට මාස 15 ක් සඳහා රු.548,376 ක වැටුප් ගෙවා තිබුණි. ඉන් රු. 200,000 ක් ආපසු අයකරගෙන තිබුණු නමුත් ඉතිරි රු.348,376 ක් සහ රජයේ ගාස්තු රු.137,094 ක් ඇතුළත් මුළු මුදල රු.485,470 ක් අයකරගෙන නොතිබුණි. |

## 3.14 කළමනාකරණ දුර්වලතා

2015 දෙසැම්බර් 31 දිනට බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ වියලි ඖෂධ ගබඩාවේ සුදු හඳුන් කිලෝ ග්‍රෑම් 1,187.97 ක් තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ සමස්ථ පරිභෝජනය කිලෝ ග්‍රෑම් 190 ක් විය. වාර්ෂිකව සුළු ප්‍රමාණයක් පාරිභෝජනය කරන සුදු හඳුන් ඉතිරි තොගය ආරක්ෂාකාරී අන්දමින් ගබඩා කරද නොතිබුණි.

## 3.15 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| --- | --- | --- | --- | --- |
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 395 | 359 | 36 |
| (ii) | තෘතියික මට්ටම | 42 | 13 | 29 |
| (iii) | ද්විතියික මට්ටම | 163 | 106 | 57 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 327 | 272 | 55 |
| | **එකතුව** | **927** | **750** | **177** |